(39)

**<u>දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 07/2004</u>**

මගේ අංකය:- ප/3/10/විවිධ.
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2004.12. 17 දින.

දෙපාර්තමේන්තුවේ සියළුම අධ්‍යක්ෂවරුන්,
ආයතන ප්‍රධානීන්.

**<u>රාජකාරි වේලාව තුළදී නිලඇඳුමින් සැරසී සිටීම</u>**

ආයතන සංග්‍රහයේ XXI වන පරිච්ඡේදයේ සඳහන් පරිදි, නිලඇඳුම් ලබාගැනීම සඳහා දීමනා හිමිකම් ලබා ඇති පහත සඳහන් සේවාවන්වල නියුක්ත නිලධාරීන් / සේවකයින් අනිවාර්යයෙන්ම රාජකාරි වේලාව තුළදී තම නිලඇඳුමින් සැරසී සිටිය යුතු බව දන්වමි.

1. පශු වෛද්‍ය නිලධාරි (සත්ව නිරෝධායන මධ්‍යස්ථානය, කටුනායක නිලධාරීන් පමණි.)
2. පශු සම්පත් සංවර්ධන නිලධාරි(සත්ව නිරෝධායන මධ්‍යස්ථානය, කටුනායක නිලධාරීන් ප්‍රමණි.)
3. රියදුරු
4. කා.සේ.සේ. I - II
5. මුරකරු.

02. මෙම නිලඇඳුම් ලබාදීමේ මූලික පරමාර්ථය වන්නේ, රාජකාරියේ යෙදී සිටිනවිට ඔවුන් සේවයක නියුක්තව සිටින අයෙකු බව පහසුවෙන් හඳුනාගත හැකිවීම සඳහාත්, කුමන අන්දමේ කාලගුණික තත්ත්වයක් යටතේ වුවද තමාට අදාල රාජකාරිය අඛණ්ඩව ඉටුකිරීමේ පහසුවත් සඳහාය.

03. තවද, මේ පිළිබඳව ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් නිලඇඳුම්ලාභීන් පිළිබඳව හා ඔවුන් එසේ නිලඇඳුම් රාජකාරී වේලාවන් තුළ ඇඟලා සිටින්නේද? එසේ නොමැතිනම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳවත් විමසීම් කර ඇති බැවින්, අනිවාර්යයෙන්ම ඔබට ලබාදී ඇති නිලඇඳුමින් සැරසී රාජකාරී ඉටුකල යුතු බව දන්වන අතර, එසේ නොවුවහොත් ඉදිරි වසරේ සිට ඔවුන් වෙනුවෙන් නැවත නිලඇඳුම් නිකුත් නොකිරීමට පියවර ගනු ලබන බවද මෙයින් දන්වනු කැමැත්තෙමි.

04. මේ සම්බන්ධයෙන් ඔබ ආයතනයේ සේවයේ නියුතු ඉහත සඳහන් සේවාවන්ට අදාල සියළුම නිලධාරීන්/ සේවකයින් දැනුවත් කිරීමට කටයුතු කරන්නේ නම් මැනවි.

ඩී.එම්.ආර්.විලසිරිය,
අධ්‍යක්ෂ (පරිපාලන).

අ.ක./එස්.කේ.ආර්.අමරසේකර,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

ද/-17.

MD. Wimala